<u>**උතුරු පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2012**</u>

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2012/05/15 වේ.

| | තනතුරු නාමය | තනතුරු අංකය |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුරේ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2012 | 01 |
| 02. | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III වන පන්තියට බඳවා ගැනීමේ තරඟ විභාගය - 2012 | 02 |

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි

1. අනුමත කරන ලද බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය කරනු ලැබේ. මෙම තනතුරු ස්ථිර සහ විශ්‍රාම හිමිකම් සහිත තනතුරු වේ.

2. මේවා ස්ථාන මාරුවට ලක්වන සේවාවන්ය. මෙම පත්වීම ලබන අය උතුරු පළාතේ කුමන හෝ ප්‍රදේශයක හෝ සේවය කිරීමට සූදානමින් සිටිය යුතුය.

## 03. සුදුසුකම්

(අ) අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
(ආ) මනා ශරීර සෞඛ්‍යයකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතුයි.

අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. එනම් මෙම අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පෙර වසර 06 ක කාලය තුළ අඩුම වශයෙන් වර්ෂ 03 ක් වත් උතුරු පළාතේ පදිංචිව සිටි අයෙකු විය යුතුය.
(අයදුම්කරු සුදුසුකම් ලබන දිස්ත්‍රික්කය තීරණය කරන විට මෙම කොන්දේසියේ සඳහන් කළ දිස්ත්‍රික්කයට සුදුසුස්සෙකු විය යුතුය. මේ අනුව තේරීම් සිදු කරනු ලැබේ)

<u>**සටහන**</u>

උතුරු පළාතේ උපන් අයකු හෝ ස්ථිර පදිංචිකරුවකුව සිටි නමුත් දැනට උතුරු පළාතේ පවත්නා අසාමාන්‍ය තත්වය හේතුකොටගෙන අවතැන් වී වෙනත් පළාත් වල තාවකාලිකව ජීවත් වන අයද මෙම තනතුරට අයදුම් කළ හැකිය. එසේනම් ඔවුන් දැනට පදිංචිව සිටින ස්ථානය ස්ථිර පදිංචි ස්ථානය බව සඳහන් කරමින් වෙනත් තනතුරු සඳහා අයදුම් නොකර තිබිය යුතුය. එය සනාථ කිරීමේ ලියකියවිලි සහ අවතැන් වී තාවකාලිකව ජීවත්වන බව සහතික කිරීමේ ලියකියවිලි ද සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.
අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සිටින අයට මෙම උපරිම වයස් ප්‍රමාණය අදාළ නොවේ)

## 04. බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරීක්ෂණයේ කුසලතාවය අනුව ද බඳවා ගන්නා අවස්ථාවේ පවත්නා චක්‍රලේඛ, බඳවා ගැනීමේ ව්‍යවස්ථාව, ජාතික හෝ පළාත් ප්‍රතිපත්ති අනුව ද බඳවාගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වේ නම් මෙම තනතුරට අදාළ හිමිකම් අවලංගු වේ. ලිඛිත පරීක්ෂණය, ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව තීරණය කරනු ලැබේ. අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා

නොකර අනිකුත් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට විභාගය සඳහා අනුමැතිය ලබා දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සියළුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. මේ අවස්ථාවේ දී අතිරේක ලකුණු ලබා දෙනු නොලැබේ. මෙම පත් වීමට තෝරා ගැනීමේ දි ස්ථිර පදිංචි ස්ථානය සැලකිල්ලට ගනු ලැබේ. මෙය පසුව මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ

<u>**සටහන**</u>

1. මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර, ඉල්ලුම් කරන ලද සුදුසුකම් වලට අදාළ විභාග ප්‍රතිඵල නිළ වශයෙන් ප්‍රකාශයට පත් කර තිබිය යුතුය. ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40% ලකුණු ප්‍රමාණයක්වත් ලබා ගත් අපේක්ෂකයන් සමත් වූ බව සැලකේ.

3. පුරප්පාඩු වලින් 3% ක් දාෂ්‍යාබාදිත පුද්ගලයන් සඳහා වෙන් කර ඇත. පත්වීම් සඳහා තොරා ගැනිමේදි දාෂ්‍යාබාදිත පුද්ගලයන් රාජකාරි කිරීමට එම දාෂ්‍යාබාදිත තත්වය රාජකාරියට බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ විය යුතු ය.

## 05. විභාග ගාස්තු

අයදුම්කරු පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රු400/= ක් ගෙවා උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 3003 දරණ තැන්පත් ගිණුමට ගෙවීම් කරන ලද මුදල් කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවෙහි නොගැළවෙන පරිදි අලවා ඉදිරිපත් කළ යුතුය. කුමන කරුණක් මත හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට අනුමත කර නොමැත.

උතුරු පළාතේ පවත්නා අසාමාන්‍ය තත්වය හේතු කොටගෙන වෙනත් පළාත් වල තාවකාලිකව අවතැන් වී ඇති අය පමණක් විභාග ගාස්තුව වශයෙන් රු400/= ක් **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, යාපනය** යන නමින් පුතුර් තැපැල් කාර්යාලයේ දී මුදල් බවට පත් කර ගැනීමට හැකි පරිදි මුදල් ඇණවුමක් ලබා අයදුම්පත සමග යා කළ යුතුය.

2011/02/28, 2011/03/01, 2011/03/11 යන දිනවල තිනක්කුරල්, දිනකරන්, දිණමිණ පුවත්පත්වල පිළිවෙලින් පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය – 2010 දැන්වීමෙ හි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුරේ පුහුණු ශ්‍රේණියට අයදුම් කල අයදුම්කරුවන් නැවත අයදුම්කලයුතු නොවේ.

විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය අලවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේක කරනු ලැබේ. මීට පෙර මෙම තනතුරු සඳහා අයදුම් කර තහවුරු වූ අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීමට අවශ්‍ය නොවේ.

## 06. අයදුම්කරන ක්‍රමය

- මෙම දැන්වීමේ අවසානයේ පෙන්නුම් කර ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ ( සෙ.මි. 21 x සෙ.මි. 29) කොළයක දෙපසම භාවිතයට ගනිමින් අයදුම්පත් සකස් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2012/05/15** දිනට පෙර **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමින් සභාව, උතුරු පළාත, 10 වෙනි සැතපුම් කණුව, පේදුරුතුඩුව පාර, ආවරංගල්, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

- තනතුර කීපයකට අයදුම් කිරීමේ සුදුසුකම් ලත් අය, නිසි අයුරින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඒ ඒ තනතුරු සඳහා වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය. නිවැරදිව සම්පූර්ණ නොකළ

අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එක් තනතුරක් සඳහා අයදුම්කළ අයදුම්පත් වෙනත් තනතුරක් සඳහා මාරු කළ නොහැකිය. මේ සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි පිළිගනු නොලැබේ.

- ඉල්ලුම්පතේ ඡායා පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පතේ ඡායා පිටපත හෝ කලින් එවනු ලබන පිටපත භාර ගනු නොලැබේ.
- මෙම විභාගයට පෙනී සිටීමට දින 07 කට ප්‍රථමයෙන් ප්‍රවේශ පත්‍ර නොලැබී තිබේනම් පහත සඳහන් විස්තර වලට අනුව "ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, 10 වැනි සැතපුම් කණුව, පේදුරුතුඩුව පාර, අවරංගල්, පුත්තූර්" යන ලිපිනයට එවිය යුතුය.

1. ඉල්ලීමේ ලිපිය.
2. විභාගයේ නම.
3. අයදුම්කරුගේ සම්පූර්ණ නම.
4. ජාතික හැඳුනුම්පත් අංකය
5. අයදුම්කරුගේ තැපැල් ලිපිනය.
6. ඉල්ලුම්පත් තැපැල් කල තැපැල් කාර්යාලය හා ලියාපදිංචි අංකය හා දිනය.

7 විභාග ගාස්තු ගෙවා ඇත්නම් එහි ඡායා පිටපත.

8. අයදුම්පත් එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය.

## 07. විභාගය නගරය

විභාගය පැවැත්වීමට යෝජිත නගර සහ අංක පහත සඳහන් අයුරු වේ.

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිලිනොච්චිය | 04 |
| මුලතිවු | 05 |

යම් නගරයක් සඳහා ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ නම්, ළඟම ඇති විභාග නගරයට මාරු කරනු ලැබිය හැකිය.

## 08. අසත්‍ය බව තහවුරු වූ විට ලැබෙන දඬුවම්

අයදුම් පත්‍ර පිරවීමේ දී ඉතා සැලකිල්ලෙන් නිවැරදි තොරතුරු සැපයිය යුතු ය. අයදුම්කරු ඉදිරිපත් යම් කිසි තොරතුරක් අසත්‍ය බව තහවුරු වුවහොත් කුමන අවස්ථාවක හෝ අපේක්ෂකයා පළාත් රාජ්‍ය සේවයේන් ඉවත් කළහැක.

## 09. 1.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුරේ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2012

මෙම තනතුර අවුරුදු 2 ක පුහුණු කාලයකින් යුක්තය. පුහුණුව අවසානයේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ විභාගයක් පැවැත්වේ. ස්ථිර පත්වීමක් ලබා ගැනීමට අභ්‍යාසලාභීන් මෙම විභාගයෙන් අනිවාර්යෙන් සමත් විය යුතුය. ඔවුන්

මෙම විභාගයෙන් අභ්‍යසලාභීන් අසමත් වුවහොත් ස්ථිර පත්වීමක් ලබා ගැනීමට සුදුසුකම් නොලබයි. විභාගයෙන් සමත් වූවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක තනතුරේ III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

**(අ) වැටුප් පරිමාණය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) හා 07/2008 ට අනුව බඳවා ගැනෙන කෘෂිකර්ම උපදේශක තනතුරේ පුහුණු ශ්‍රේණිය සඳහා මාසික වැටුප් පරිමාණය රු13,120-1x145-13265(MN-1-2006-A) වේ.

**(ආ) අධ්‍යාපන සුදුසුකම්**

1. අ.පො.ස (සා/පෙ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව/සාහිත්‍ය, ගණිතය, විද්‍යාව යන විෂයන් 3 ඇතුළුව සම්මාන සමාර්ථ 04 ක් සහිතව විෂයයන් 06 කින් සමත්විය යුතුය.

මේ සමඟ

අ.පො.ස (උ/පෙ) විභාගයෙන් එක් වරකදී විද්‍යා විෂයයන් වන රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, ජීව විද්‍යාව කෘෂිකර්ම විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන3 ක් සමත් විය යුතුය.

## 9.1.2 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III පන්තියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2012

**(අ) වැටුප් පරිමාණය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) ) හා 07/2008 ට අනුව බඳවා ගැනෙන කෘෂිකර්ම උපදේශක III වන පන්තියේ මාසික වැටුප් ප්‍රමාණය රු 15,005-4x180-14x240-19,085(MN-3-2006 A) වේ.

**(ඇ) අධ්‍යාපන සුදුසුකම්**

1. ඉහත 9.1.1 (ආ) හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව පහත සඳහන් සුදුසුකම් වලින් එකක් සම්පූර්ණ කළ යුතුය.

   I. කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදුව, වාරියපොළ, වවුනියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාල වලින් අවුරුදු 02 ක කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබිය යුතුය.

   හෝ

   II. අම්පාර හාඩි තාක්ෂණික සේවා ආයතනයේ කෘෂිකර්ම තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබිය යුතුය.

   හෝ

   III. ඇක්වයිනාස් පාසලෙන් අවුරුදු 02 ක කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

   හෝ

   IV. ඉහත සුදුසුකම් වලට සමාන උතුරු පළාත් තාක්‍ෂණික සේවා සභාව මගින් සුදුසු පරික්‍ෂාවකින් පසුව පිළිගත් තාක්‍ෂණික සුදුසුකම්

   හෝ

   V උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පිළිගත් ඉහත සඳහන් සුදුසුකම් වලට සමාන නැතහොත් උසස් සුදුසුකම් ( උදා :- කෘෂිකර්ම විද්‍යාවේදී උපාධිය)

<u>සටහන</u>

කෘෂිකර්ම උපදේශක තනතුරේ පුරප්පාඩු වලින් 10% ක් දෙපාර්තමේන්තු අයදුම්කරුවන් වෙනුවෙන් වෙන් කෙරේ.

**10 . ලිඛිත පරීක්ෂණය**

9.1.1, 9.1.2 මෙම තනතුරු දෙකටම එක් තරග විභාගයක් පමණක් පැවැත්වේ. මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන්ම පැවැත්වේ. මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 2 කින් සමන්විත වේ.

මෙම විභාගය සඳහා වන විෂයයන් පහත පරිදි වේ.

| **ප්‍රශ්න පත්‍රය** | **කාලය** | **ලකුණු** |
|---|---|---|
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 |
| අභියෝග්‍යතාවය | පැය 01 | 100 |

**<u>සාමාන්‍ය දැනීම</u>**

**I වන කොටස ලකුණු 50**

මෙම ප්‍රශ්න පත්‍රය මඟින් අයදුම්කරුගේ දේශිය විදෙශිය මට්ටමේ ඇති සමාජ, ආර්ථික, දේශපාලන හා වෙනත් විෂයන් පිළිබද සාමාන්‍ය දැනීම පරීක්ෂා කරනු ලැබේ.

**II වන කොටස ලකුණු 50**

මෙම කොටසින් අයදුම්කරුගේ කෘෂිකර්ම තාක්ෂණය පිළිබද දැනුම පරීක්ෂා කරනු ලැබේ.

**<u>අභියෝග්‍යතාවය</u>**

මෙම ප්‍රශ්න පත්‍රය මඟින් අයදුම්කරුගේ තර්කානුකූල හැකියාව, විශ්ලේෂණය කිරීමේ හැකියාව, හා තීර්ණ ගැනිමේ හැකියාව, සාමාන්‍ය බුද්ධි පරීක්ෂණය යනාදිය පරීක්ෂා කරනු ලැබේ.

**<u>සටහන</u>**

1. අපැහැදිළි අත් අකුරු හා දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. අපැහැදිළි අත්අකුරු සහිත අයදුම්කරු තම සුදුදුසුකම් අහිමි කර ගනු ලැබේ.

2. මෙම පත්වීමට සුදුසුකම් ලැබිම සඳහා ලිඛිත පරික්ෂණයේ එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහා අවම වශයෙන් 40% ක් ලබා ගත යුතු ය.

මෙම දැන්වීමේ සඳහන් නොකළ හෝ අපහැදිළි කරුණු සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවසන් තීරණය කරනු ලැබේ. ඒ සමඟම භාෂා පරිවර්තනයේ දී සිදුවන වෙනස්කම් පිළිබඳව සැලකිමේදි දෙමළ භාෂාව නිවැරදි වේ.

මෙම දැන්වීම උතුරු පළාත් සභාවේ www.np.gov.lk වෙබ් අඩවිය තුළද අන්තර්ගතය.

ආර් තියාගලිංගම්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.